ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2303/11 - 2022 ඔක්තෝබර් මස 26 වැනි බදාදා - 2022.10.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංක:* 4-3/17/2019/D/513.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* KLP/LAND/07/19/17-II.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශතාවේ විස්තර :*

පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඩච්බේ ග්‍රාම නිලධාරි වසමේ සර්වේ ජනරාල්ගේ අංක මු.පී.පු. 5554, කැබලි අංක 1 සහ 2022. 09.28 දින දරන පිඹුරේ සඳහන් ප්‍රමාණයේ හෙක්ටයාර් 0.0600 ක් වූ ආරක්ෂක අමාත්‍යාංශයේ අවශ්‍යතාවය සඳහා කන්දකුලිය නාවික හමුදා නිරීක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා වූ ඉඩම.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම : ඉලම්පිල්ලෙයි තෝට්ටම්; ඉඩමේ විස්තරය: සර්වේ ජනරාල්ගේ පිඹුරු අංක මු.පී.පු. 5554 හි කැබලි අංක 1 හා 2022.09.28 දින දරන පිඹුර; හිමිකම් කියන අයගේ විස්තර: සාහුල් හමීඩ් මොහොමඩ් උවයිස්, ප්‍රධාන වීදිය, කන්දකුලිය; ප්‍රමාණය: හෙක්. 0.0600.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.01.09 වැනි දින පෙ.ව.10.30 ට කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023.01.02 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් ස්වභාවය එකී ඉඩම්/ පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩී.ඒ.පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
කල්පිටිය.

2022 ඔක්තෝබර් මස 17 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කල්පිටිය.

EOG 10-0224

1A : G 37862 – 21 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* DSM/PL/LAND/අකු/ක්‍රීඩා පි/අත්.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/8/2016/PC/530.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ දැන්වීම මා විසින් පළ කළ අංක 2291/06 හා 2022 අගෝස්තු මස 01 වැනි දින *ගැසට් පත්‍රයේ* සඳහන් හිමිකම් පරීක්ෂණය හා වන්දි පරීක්ෂණය දිනය හා වේලාව වෙනුවට 2023 ජනවාරි මස 23 වැනි දින පෙ.ව.10.00 ලෙස සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙමි.

එච්. එම්. සී. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පල්ලේපොල.

EOG 10-0225